
# දඟකාර හා පැංචා



සෙනුජි සිත්මිණි රූපසිංහ

# දඟකාර හා පැංචා

සෙනුජි සිත්මිණි රූපසිංහ

ප්‍රථම මුද්‍රණය : **2025.02.08**

කර්තෘ : **සෙනුපි සිත්මිණි රූපසිංහ**

ISBN අංකය : **978-624-208-660-6**

**මුද්‍රණය :**
**"PRESS"**
**නො.24, කොටුගොඩැල්ල වීදිය,**
**මහනුවර.**

# පිදුම

කන්ද උඩරට සෙංකඩගල පුර ශ්‍රී

දළදා සමිඳු අභියස රැදෙන.......

මහමායා බාලිකා විදු පියසේ සිප්

සතර හදාරන මා.......

මාගේ ආදරණීය දෙමව්පියන් සහ

සිප්සතර ලබාදෙන මාගේ ආදරණීය

ගුරු මෑණිවරුන්ට සහ පියවරුන්ට,

මාගේ ආදරණීය සහෝදරියන්ට

මෙම පොත පිළිගන්වමි !

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "**හෙරණගත්කරණී**" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,


ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


එක ගමක හා පවුලක් හිටියා. ඒ අම්මයි,
තාත්තයි, පුතයි. මේ පුතා හරිම දඟයි.
වැඩිහිටියන් කියන  කිසිවක් ඇහුවේ නෑ.



දවසක් අම්මයි, තාත්තයි කෑම හොයාගෙන ගිය පසු දඟකාර හා පුතා හැමෝටම හොරෙන් යන්නට සූදානම් වුණා. හෙමින් හෙමින් කැලයට ගියා.



එයා කවදාවත් කැලේ දැකලා නෑ. නටමින්,
ගී ගයමින් සතුටින් කැලයට ගියා.



දැන් ගෙදර එන්න පාර මතක නෑ. හා පුතා හොඳටම බය වුණා. අම්මට තාත්තට කතා කළා කවුරුත් නෑ.





හා පුතා අඬන්න පටන් ගත්තා. උදව්වට කවුරුත් නෑ.

එයාට අම්මව මතක් වුණා. මම එයාලා කියන දේ ඇහුවනම් මට මෙහෙම වෙන්නේ නෑ. තනියම අඬමින් එහෙම හිතුවා.



කෑම හොයාගෙන ගෙදර ආ දෙමාපියන් පුතා නැතිව කලබල වුණා. එයාලත් අඬමින් පුතා හෙව්වා. කවුරුත් දන්නේ නෑ පුතා කොහෙද කියලා.




දැන් රෑ වීගෙන එනවා. හැමෝම හා පුතා හොයන්න ආවා. හැම තැනම හෙව්වා.




පසු දින වඳුරු රාල හා පුතා එක්කරගෙන ආවා.



එයා හොඳටම බය වෙලා අම්මා ළඟට දුවගෙන විත් අම්මා බදාගෙන සමාව ඉල්ලුවා.



ආයේ කවදාවත් ඔයාලට නොකියා කොහෙවත් යන්නේ නෑ. හා පැංචා පොරොන්දු වුණා.





# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට අල්බක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්නයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තරබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්.

ISBN අංකය : **978-624-208-660-6**